සැ. යු.-2010.01.01 දින පළ වූ අංක 1,635 දරන *ගැසට් පත්‍රයේ* II කොටස පළ නොවිය.
මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ ජූරි සභික නාමාවලියක් පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,636 - 2010 ජනවාරි මස 08 වැනි සිකුරාදා - 2010.01.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 202 |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියළුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 ජනවාරි මස 15 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 ජනවාරි මස 01 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# පළාත් සභා නිවේදන

**සබරගමුව පළාත් සභාවේ 2009 අංක 06 දරන විසර්ජන ප්‍රඥප්තිය**

සහතිකය සටහන් කළේ : 2009.12.03
අනුමැතිය ලැබුණේ : 2009.12.15

සබරගමුව පළාත් සභාවේ නියමය පරිදි,

ලලිත් දොඩම්කොටුව,
සභා ලේකම්,
සභා ලේකම් කාර්යාලය,
සබරගමුව පළාත් සභාව.

**සබරගමුව පළාත් සභාව විසර්ජන ප්‍රඥප්තිය අංක 06 — 2009**

2010 මුදල් වර්ෂයේ සේවා වියදම් සඳහා විධිවිධාන සැලසීමත්, එම සේවා වියදම් සඳහා සබරගමුව පළාත තුළ ණය ලබා ගැනීමට බලය දීමත්, ඒ මුදල් වර්ෂය තුළ සබරගමුව පළාත් සභාවේ ඇතැම් කටයුතු වෙනුවෙන් මුල්‍ය ප්‍රතිපාදන සැපයීමත්, එම කටයුතු වෙනුවෙන් වියදම් සඳහා ඒ මුදල් වර්ෂය තුල අවශ්‍ය වන මුදල් සබරගමුව පළාත් සභා අරමුදලෙන් හෝ වෙනත් යම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීමට ඉඩ සැලසීමත්, සබරගමුව පළාත් සභා අරමුදලට ඒ මුදල් ආපසු ගෙවීමට විධිවිධාන සැලසීම සහ යථෝක්ත කරුණු හා සම්බන්ධ වූ හෝ එයට අනුෂාංගික වූ කරුණු සඳහා විධිවිධාන සැලසීමත් සඳහා වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාත් සභාව විසින් මෙයින් පනවනු ලැබේ :–

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය

1. මේ ප්‍රඥප්තිය සබරගමුව පළාත් සභාවේ 2009 අංක 06 දරන විසර්ජන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර සබරගමුව පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණු දින සිට ක්‍රියාත්මක වන්නේ ය.

2010 මුදල් වර්ෂය සඳහා විසර්ජන

2. (1) යම් මුදලක් වැය කිරීමට බලය දෙන්නාවූ අන්කිසි නීතියකට හානියක් නොමැතිව, මේ ප්‍රඥප්තියෙහි ''2010 මුදල් වර්ෂය'' යනුවෙන් සඳහන් කරනු ලබන, 2010 ජනවාරි මස 01 වැනි දිනයෙන් ආරම්භව 2010 දෙසැම්බර් මස 31 වැනි දිනයෙන් අවසන් වන කාලසීමාවේ සේවා වියදම් සඳහා අවශ්‍ය වේ යයි තක්සේරු කර ඇති රුපියල් එක් දහස් තුන්සිය අසූ දෙකෝටි අසූහත් ලක්ෂ හැට නව දහසක් (රු. 13,828,769,000) වූ සබරගමුව පළාත් සභාවේ වියදම්:-

*(අ)* සබරගමුව පළාත් සභා අරමුදලින් හෝ වෙනත් යම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ගෙවීම සඳහා මෙයින් බලය දෙනු ලබන ගෙවීම්වලින් හා,

*(ආ)* සබරගමුව පළාත තුළ ණය වශයෙන් ලබාගන්නා මුදල්වලින් හෝ සබරගමුව පළාත් සභාව සඳහා ලබා ගැනීමට මෙයින් බලය දෙනු ලබන ණය වශයෙන් ගන්නා මුදල්වලින් පියවිය යුතුය. මෙහි ඉහත සඳහන් කළ රුපියල් එක් දහස් තුන්සිය අසූ දෙකෝටි අසූහත් ලක්ෂ හැට නව දහසක් (රු. 13,828,769,000) වූ මුදල මේ ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ නියමිත පරිදි වැය කළ හැකිය.

(2) මේ වගන්තියේ (1) වැනි උපවගන්තියෙහි විධිවිධාන සබරගමුව පළාත් සභාව සඳහා හා එය වෙනුවෙන් ණය ලබා ගැනීමට බලය දෙනු ලබන අන්කිසි ලිඛිත නීතියකට විධිවිධානවලට හානියක් නොමැතිව බලපැවැත්විය යුතුය.

2010 මුදල් වර්ෂය සඳහා සබරගමුව පළාත් සභාවේ ඇතැම් කටයුතු වෙනුවෙන් මුදල් සැපයීම

3. (1) 2010 මුදල් වර්ෂය තුලදී, මේ ප්‍රඥප්තියෙහි දෙවන උපලේඛනයේ IV වැනි තීරුවේ සඳහන් එක් එක් කටයුත්තෙන් සබරගමුව පළාත් සභාවට ලැබෙන VI වැනි තීරුවෙහි සඳහන් ලැබීම් එම කටයුත්තේ ගිණුමට බැර කළ යුතු අතර, එසේ බැර කරනු ලැබූ ලැබීම්වල සමස්ථය, VI වැනි තීරුවෙහි දැක්වෙන අවම සීමාවට අඩු නොවිය යුතුය. එසේ ලැබෙන ශුද්ධ අතිරික්තයක් වේ නම්, එය 2010 මුදල් වර්ෂය අවසන් වී හය මාසයක් ඉකුත්වීමට පෙර සබරගමුව පළාත් සභා අරමුදලට ගෙවිය යුතුය

(2) 1 වැනි උපවගන්තිය යටතේ ශුද්ධ අතිරික්තය නිගමනය කිරීමේ කාර්යය සඳහා පහත දැක්වෙන ගෙවීම්, එනම් :-

*(අ)* කිසියම් කටයුත්තක ආදායමට අයවිය යුතුව නිසි අයුරින් ගෙවනු ලැබූ හෝ උපචිත වූ හෝ එම කටයුත්තේ කාර්ය සාධන, සංස්ථාපනය හා වෙනත් වියදම් ; සහ

*(ආ)* කිසියම් කටයුත්තක නිශ්චල හා චංචල දේපල වෙනුවෙන් ක්ෂයවීම ආවරණය සඳහා ප්‍රතිපාදන ඒ එක් එක් කටයුත්තක ආදායමින් අඩු කළ යුතුය.

4. මේ ප්‍රඥප්තියෙහි දෙවැනි උපලේඛනයේ IV වැනි තීරුවෙහි දැක්වෙන එක් එක් කටයුත්ත සම්බන්ධයෙන් 2010 මුදල් වර්ෂය තුල සබරගමුව පළාත් සභාව විසින් කරනු ලබන වියදම්, ඒ මුදල් වර්ෂය තුල දී එම කටයුත්තෙන් සබරගමුව පළාත් සභාව

ලබන ලැබීම්වලින් ගෙවිය යුතුය. එහෙත් එම වියදම් එම උපලේඛනයේ V වැනි තීරුවෙහි අනුරූප සටහනෙහි දැක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතුය.

5. මේ ප්‍රඥප්තියෙහි දෙවන උපලේඛනයේ IV වැනි තීරුවෙහි දැක්වෙන කිසියම් කටයුත්තක් සම්බන්ධයෙන් 2010 මුදල් වර්ෂය අවසානයේ දී හිඟව ඇති හර ශේෂය, එම උපලේඛනයේ VII වැනි තීරුවෙහි අනුරූප සටහනෙහි දැක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතුය. තව ද, එම මුදල් වර්ෂය අවසානයේ දී එම කටයුත්තේ මුළු බැරකම් VIII වැනි තීරුවෙහි අනුරූප සටහනෙහි දැක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතුය.

2010 මුදල් වර්ෂය තුළදී 3 වැනි වගන්තියේ සඳහන් කටයුතු පිළිබඳ වියදම් සඳහා සබරගමුව පළාත් සභා අරමුදලෙන් හෝ සබරගමුව පළාත් සභාව විසින් සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් නැතහොත් මුදල්වලින් අත්තිකාරම් ගෙවීම

6. 2010 මුදල් වර්ෂය තුල යම් අවස්ථාවක මේ ප්‍රඥප්තියේ දෙවැනි උපලේඛනයේ IV වැනි තීරුවෙහි දැක්වෙන යම් කටයුත්තකින් සබරගමුව පළාත් සභාවට ලැබෙන ලැබීම්, ඒ කටයුත්ත සම්බන්ධයෙන් සබරගමුව පළාත් සභාව විසින් දරනු ලැබූ වියදම් පියවීමට ප්‍රමාණවත් නොවේ නම්, එම වියදම් පියවීම සඳහා යැයි අමාත්‍යවරයා සළකන මුදල් සබරගමුව පළාත් අරමුදලෙන් හෝ සබරගමුව පළාත් සභාව විසින් සුදුස්සක් කළ හැකි හෝ වෙනත් අරමුදලක් හෝ මුදල් අත්තිකාරම් වශයෙන් ගෙවිය යුතු යැයි ඔහු විසින් නියමයක් මගින් කලින් කල විධාන කරනු ලැබිය හැකිය. එහෙත් එසේ දෙනු ලබන අත්තිකාරම් මුදල්වල සමස්ථය එම උපලේඛනයේ V වැනි තීරයේ අනුරූප සටහනේ දැක්වෙන උපරිම වියදම් සීමාව නොඉක්මවිය යුතුය. එකී කටයුත්ත වෙනුවෙන් අත්තිකාරම් වශයෙන් එසේ දෙන ලද මුදල් කිසිවක්, අමාත්‍යවරයා විසින් නියමයක් මගින් විධාන කරනු ලබන ආකාරයට සබරගමුව පළාත් සභා අරමුදලට ආපසු ගෙවිය යුතුය.

වැඩ සටහන පුනරාවර්තන වියදම් සඳහා වෙන්කරන ලද නමුත් වියදම් නොකරන ලද මුදල් ඒ වැඩ සටහනේම වෙනත් වෙන් කිරීමකට හෝ ඒ වැය ශීර්ෂය යටතේම වූ වෙනත් වැඩ සටහනකට හෝ මාරු කිරීමේ බලය

7. (1) මේ ප්‍රඥප්තියෙහි පළමුවන උපලේඛනයේ සඳහන් යම් ශීර්ෂයක් යටතේ දැක්වෙන යම් වැඩසටහනක් යටතේ වූ පුනරාවර්තන වියදම්වලට එම උපලේඛනයේ විධිවිධාන ප්‍රකාර, වෙන් කරනු ලැබුවා වූ ද, එහෙත් වියදම් නොකරන ලද්දා වූ හෝ මතුවට වියදම් නොකෙරෙනු ඇතැයි බලාපොරොත්තු විය හැකි වූ ද යම් මුදලක්, එම වැඩසටහනේම මූලධන වියදම් වශයෙන් හෝ වෙනත් වැඩසටහනක පුනරාවර්තන හෝ මූලධන වියදම් වශයෙන් හෝ වෙන් කිරීමට හෝ ප්‍රධාන ලේකම්වරයාගේ හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් නිලධාරියකුගේ හෝ නියමය අනුව මාරුකළ හැකිය.

(2) මේ ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ සඳහන් යම් ශීර්ෂයක් යටතේ දැක්වෙන මූලධන වියදමට වෙන් කරන ලද මුදලක් ඒ ශීර්ෂයේ වැඩසටහනෙන් හෝ ව්‍යාපෘතියෙන් පිටතට මාරු කිරීම ප්‍රධාන ලේකම්වරයාට පමණක්ම කළ හැකිය.

8. (1) බලය දෙනු ලැබූ වියදම් දැරීමට බදුවලින් සහ වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබෙන ලැබීම්, බලාපොරොත්තු වූ මුදල්වලට වඩා අඩු වියහැකි බවට ; හෝ

(2) යම් කිසි කාර්යයක් හෝ කාර්යයන් සඳහා මුලින් විසර්ජිත මුදල් තවදුරටත් අවශ්‍ය නොවන බවට අමාත්‍යවරයා සෑහීමකට පත්වන අවස්ථාවක, සබරගමුව පළාත් සභා අරමුදලින් හෝ සබරගමුව පළාත් සභාව හෝ සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල්වලින් තමා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරිය යටතේ වියදම් කිරීම සඳහා කලින් මුදාහරින ලද මුදල් සම්පූර්ණයෙන්ම හෝ ඉවත් කර ගැනීම, අමාත්‍යවරයා විසින් සබරගමුව පළාත් සභාවේ අනුමැතිය ඇතිව කරනු ලැබිය හැකිය.

9. අමාත්‍යවරයා විසින්, සබරගමුව පළාත් සභාවේ අනුමැතිය ඇතිව –

මේ ප්‍රඥප්තියෙහි දෙවන උපලේඛනයේ දැක්වෙන උපරිම හා අවම සීමා වෙනස් කිරීමට අමාත්‍යවරයාට ඇති බලය.

*(අ)* මේ ප්‍රඥප්තියෙහි දෙවන උපලේඛනයේ V වැනි තීරයෙහි, VII වැනි තීරයෙහි සහ VIII වැනි තීරයෙහි දැක්වෙන උපරිම සීමා අතුරින් කිසිවක් ;

*(ආ)* මේ ප්‍රඥප්තියෙහි දෙවැනි උපලේඛනයේ VI වැනි තීරයෙහි දැක්වෙන අවම සීමා
නියමයන් මගින් 2011 මැයි මස 31 වැනි දින හෝ එදිනට පෙර, වෙනස් කිරීම හෝ අමුතු කිරීම හෝ කරනු ලැබිය හැකිය.

මේ වගන්තිය යටතේ කරන ලද කිසිම නියමයක්, යෝජනා සම්මතයක් මගින් සබරගමුව පළාත් සභාව විසින් එය අනුමත කර ඇත්නම් මිස, බලනොපැවැත්විය යුතුය.

එවැනි යම් නියමයක් කරනු ලබන්නේ යම් දිනයක ද, ඒ දිනට පෙරාතුව වූ දිනක සිට එය බලාත්මක විය යුතුයැයි එහි ප්‍රකාශිතවම සඳහන් වන්නේ නම් එසේ ප්‍රකාශිතවම සඳහන් වන දින සිට එය බලාත්මකවූ ලෙස සැලකිය යුතුය.

10. සබරගමුව පළාත් සභාව විසින්, යෝජනා සම්මතයක් මගින්, මේ ප්‍රඥප්තියෙහි දෙවන උපලේඛනයෙහි උචිත තීරුවලට යම් කටයුත්තක් එකතු කිරීමෙන් සහ :-

*(අ)* එම කටයුත්ත සම්බන්ධයෙන් වූ සියලුම උපරිම සීමා හෝ ඉන් යම් සීමාවක්.

*(ආ)* එම කටයුත්ත සම්බන්ධයෙන් වූ අවම සීමාව
එකතු කිරීමෙන් ඒ උපලේඛනය සංශෝධනය කළ හැකිය.

## පළමුවැනි උපලේඛනය

### පළාත් සභා පොදු සේවාවන් සඳහා ගෙවිය යුතු මුදල්

ශීර්ෂ 800 සිට 861 දක්වා

| | රු. |
|---|---|
| පුනරාවර්තන වියදම් | 115,685,96,000 |
| ප්‍රාග්ධන වියදම් | 2,260,173,000 |
| එකතුව | 13,828,769,000 |

| ශීර්ෂය | පුනරාවර්තන වියදම් රු. | ප්‍රාග්ධන වියදම් රු. |
|---|---|---|
| 800 - ගරු ආණ්ඩුකාරතුමා | | |
| වැඩසටහන 03 පළාත් පරිපාලනය | 33,358,000 | 1,000,000 |
| 801- පළාත් සභා ලේකම් කාර්යාලය | | |
| වැඩසටහන 03 පළාත් පරිපාලනය | 86,983,000 | 1,000,000 |
| 802 - පළාත් රාජ්‍ය සේවා කොමිෂම | | |
| වැඩසටහන 03 පළාත් පරිපාලනය | 10,154,000 | 500,000 |
| 803 - සමුපකාර සේවක කොමිෂන් සභාව | | |
| වැඩසටහන 03 පළාත් පරිපාලනය | 3,927,000 | – |
| 804 - ප්‍රධාන ලේකම් | | |
| වැඩසටහන 03 පළාත් පරිපාලනය | 134,143,000 | 456,120,000 |
| 805 - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන හා පුහුණු) | | |
| වැඩසටහන 03 පළාත් පරිපාලනය | 22,540,000 | – |
| 806 - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුල්‍ය කළමනාකරණ) | | |
| වැඩසටහන 03 පළාත් පරිපාලනය | 19,436,000 | – |
| 807 - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ක්‍රම සම්පාදන) | | |
| වැඩසටහන 03 පළාත් පරිපාලනය | 13,055,000 | – |
| 808 - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) | | |
| වැඩසටහන 50 - ඉදිකිරීම් හා මාර්ග නඩත්තුව | 103,295,000 | – |
| 809 - පළාත් ආදායම් දෙපාර්තමේන්තුව | | |
| වැඩසටහන 03 පළාත් පරිපාලනය | 35,706,000 | – |
| 810 - නීතිය හා සාමය, මුදල් හා සැලසුම්, පළාත් පාලන, අධ්‍යාපන හා තොරතුරු තාක්ෂණ, ප්‍රවෘත්ති, සංස්කෘතික හා ක්‍රීඩා කටයුතු, විදුලිබල නිවාස හා ඉදි කිරීම්, සමුපකාර, වෙළඳ හා ආහාර, මඟී ප්‍රවාහන හා වතු සුභසාධන කටයුතු අමාත්‍යාංශය : | | |
| වැඩසටහන 03 -පළාත් පරිපාලනය | 67,690,000 | 15,000,000 |
| වැඩසටහන 47 - ප්‍රවාහන සේවා | - | 30,000,000 |
| වැඩසටහන 49 -විදුලි බල හා බල ශක්ති | - | 40,000,000 |
| වැඩසටහන 53 - සමුපකාර සංවර්ධනය | - | 9,000,000 |
| වැඩසටහන 60 - ප්‍රජා සංවර්ධනය | - | 90,000,000 |
| වැඩසටහන 61 - නිවාස හා ප්‍රජා පහසුකම් | 3,182,000 | 25,000,000 |
| වැඩසටහන 63 - වතු යටිතල පහසුකම් හා වතු නිවාස | - | 10,000,000 |
| වැඩසටහන 80 - ප්‍රාථමික අධ්‍යාපනය | - | 206,500,000 |
| වැඩසටහන 81 - ද්විතීයික අධ්‍යාපනය | - | 226,000,000 |

| ශීර්ෂය | පුනරාවර්තන වියදම් රු. | ප්‍රාග්ධන වියදම් රු. |
|---|---|---|
| වැඩසටහන 90 - විනෝද කටයුතු හා ක්‍රීඩා | - | 35,000,000 |
| වැඩසටහන 93 - ආගමික හා සංස්කෘතික කටයුතු | 2,360,000 | 17,500,000 |
| 811 - අධ්‍යාපන දෙපාර්තමේන්තුව | | |
| වැඩසටහන 03 - පළාත් පරිපාලනය | 191,427,000 | - |
| වැඩසටහන 80 - ප්‍රාථමික අධ්‍යාපනය | 2,200,461,000 | - |
| වැඩසටහන 81 - ද්විතීයික අධ්‍යාපනය | 4,235,114,000 | - |
| වැඩසටහන 87 - අධ්‍යාපන සහභාගිත්වය වැඩි දියුණු කිරීම | 11,688,000 | - |
| වැඩසටහන 88 - අධ්‍යාපන සැළසුම්කරණය පාලනය හා සේවා සැපයීම | 12,662,000 | - |
| 812 - පළාත් පාලන දෙපාර්තමේන්තුව | | |
| වැඩසටහන 60- ප්‍රජා සංවර්ධනය | 814,220,000 | - |
| 813- සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | | |
| වැඩසටහන 53- සමූපකාර සංවර්ධනය | 37,289,000 | - |
| 814- ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | | |
| වැඩසටහන 90- විනෝද කටයුතු හා ක්‍රීඩා | 9,384,000 | - |
| 820 - පළාත් මාර්ග සංවර්ධන ග්‍රාමීය යටිතල පහසුකම් සහ සංචාරක අමාත්‍යාංශය | | |
| වැඩසටහන 03 - පළාත් පාරිපාලනය | 24,505,000 | - |
| වැඩසටහන 50 - ඉදිකිරීම් හා මාර්ග නඩත්තුව | 175,000,000 | 450,000,000 |
| වැඩසටහන 52 - ප්‍රාදේශීය සංවර්ධනය | - | 25,000,000 |
| වැඩසටහන 90 - විනෝද කටයුතු හා ක්‍රීඩා | - | 32,000,000 |
| 830 - සමාජ සුහසාධන, පරිවාස හා ළමාරක්ෂක, ග්‍රාම සංවර්ධන සහ ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය | | |
| වැඩසටහන 03- පළාත් පරිපාලනය | 21,978,000 | - |
| වැඩසටහන 51- කර්මාන්ත සංවර්ධනය | - | 28,000,00 |
| වැඩසටහන 60- ප්‍රජා සංවර්ධන කටයුතු | 13,319,000 | 17,000,000 |
| වැඩසටහන 95 - සමාජ ආරක්ෂණය | - | 47,000,000 |
| 831- කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව | | |
| වැඩසටහන 51 - කර්මාන්ත සංවර්ධනය | 88,516,000 | - |
| 832- සමාජ සේවා දෙපාර්තමේන්තුව | | |
| වැඩසටහන 95- සමාජ ආරක්ෂණය | 88,311,000 | - |
| 833- පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව | | |
| වැඩසටහන 95- සමාජ ආරක්‍ෂණය | 33,871,000 | - |
| 840 - සෞඛ්‍ය, දේශීය වෛද්‍ය හා වනිතා කටයුතු අමාත්‍යාංශය | | |
| වැඩසටහන 03- පළාත් පරිපාලනය | 27,678,000 | - |
| වැඩසටහන 71- රෝහල් සේවාවන් | - | 194,400,000 |
| වැඩසටහන 72- මහජන සෞඛ්‍ය සේවාවන් | - | 113,153,000 |
| වැඩසටහන 73- දේශීය සෞඛ්‍ය සේවාවන් | - | 45,000,000 |
| වැඩසටහන 96- කාන්තා සංවර්ධනය | - | 10,000,000 |
| 841- සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | | |
| වැඩසටහන 03- පළාත් පරිපාලනය | 115,516,000 | - |
| වැඩසටහන 71- රෝහල් සේවාවන් | 2,028,568,000 | - |
| වැඩසටහන 72- මහජන සෞඛ්‍ය සේවාවන් | 529,148,000 | - |
| 842- ආයුර්වේද දෙපාර්තමේන්තුව | | |
| වැඩසටහන 73- දේශීය වෛද්‍ය සේවාවන් | 146,531,000 | - |
| 850- ඉඩම්, පළාත් වාරිමාර්ග, කෘෂිකර්ම, සත්ව නිෂ්පාදන හා සත්ව | | |

| ශීර්ෂය | පුනරාවර්තන වියදම් රු. | ප්‍රාග්ධන වියදම් රු. |
|---|---|---|
| සෞඛ්‍ය පරිසර කටයුතු සහ ධීවර අමාත්‍යාංශය | | |
| වැඩසටහන 03- පළාත් පරිපාලනය | 26,731,000 | 2,000,000 |
| වැඩසටහන 40- ඉඩම් පරිපාලනය හා සංවර්ධනය | - | 8,000,000 |
| වැඩසටහන 43- වාරිමාර්ග හා ජල කළමණාකරණය | - | 30,000,000 |
| වැඩසටහන 44- කෘෂිකාර්මික සංවර්ධනය | - | 50,000,000 |
| වැඩසටහන 45- පශු සම්පත් සංවර්ධනය | - | 41,000,000 |
| වැඩසටහන 55- ආහාර සුරක්ෂිතතා පවත්වාගෙන යාම | | 3,000,000 |
| වැඩසටහන 57- පරිසර සංරක්ෂණය | | 2,000,000 |
| 851- ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව | | |
| වැඩසටහන 40- ඉඩම් පරිපාලනය හා සංවර්ධනය | 9,440,000 | - |
| 852- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | | |
| වැඩසටහන 44- කෘෂිකර්ම සංවර්ධනය | 86,731,000 | - |
| 853- සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | | |
| වැඩසටහන 45 - පශු සම්පත් සංවර්ධනය | 93,253,000 | - |
| 861- පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව | | |
| වැඩසටහන 3- පළාත් පරිපාලනය | 11,426,000 | - |
| එකතුව | 11,568,596,000 | 2,260,173,000 |
| | =========== | =========== |

## දෙවන උපලේඛනය

### අත්තිකාරම් ගිණුම් කටයුතු

| i | ii අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු | iii විෂය අංකය | iv අත්තිකාරම් වර්ගය | v උපරිම වියදම් සීමාව | vi අවම ලැබීම් සීමාව | vii හර ශේෂයේ උපරිම සීමාව | viii බැරකම්වල උපරිම සීමාව |
|---|---|---|---|---|---|---|---|
| | පළාත් රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් | | | | | | |
| 1 | ආණ්ඩුකාරතුමාගේ කාර්යාලය | 8001 | පළාත් රාඃ නිඃ අත්තිකාරම් | 2,500,000 | 450,000 | 4,600,000 | |
| 2 | පළාත් සභා ලේකම් කාර්යාලය | 8011 | පළාත් රාඃ නිඃ අත්තිකාරම් | 2,200,000 | 500,000 | 6,900,000 | |
| 3 | පළාත් රාජ්‍ය සේවා කොමිෂම | 8021 | පළාත් රාඃ නිඃ අත්තිකාරම් | 2,000,000 | 600,000 | 4,000,000 | |
| 4 | සමුපකාර සේවක කොමිෂන් සභාව | 8031 | පළාත් රාඃ නිඃ අත්තිකාරම් | 900,000 | 250,000 | 2,000,000 | |
| 5 | ප්‍රධාන ලේකම් | 8041 | පළාත් රාඃ නිඃ අත්තිකාරම් | 25,000,000 | 4,500,000 | 69,000,000 | |
| 6 | ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව | 8081 | පළාත් රාඃ නිඃ අත්තිකාරම් | 25,000,000 | 6,000,000 | 35,000,000 | |
| 7 | පළාත් ආදායම් දෙපාර්තමේන්තුව | 8091 | පළාත් රාඃ නිඃ අත්තිකාරම් | 4,000,000 | 1,000,000 | 7,000,000 | |
| 8 | නීතිය හා සාමය, මුදල් හා සැලසුම්, පළාත් පාලන, අධ්‍යාපන හා තොරතුරු තාක්ෂණ, ප්‍රවාත්ති, සංස්කෘතික හා ක්‍රීඩා කටයුතු, විදුලිබල, නිවාස හා ඉදිකිරීම්, සමුපකාර, වෙළඳ හා ආහාර, මගී ප්‍රවාහන හා වතු සුහසාධන කටයුතු අමාත්‍යාංශය | 8101 | පළාත් රාඃ නිඃ අත්තිකාරම් | 10,000,000 | 1,500,000 | 15,500,000 | |
| 9 | අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 8111 | පළාත් රාඃ නිඃ අත්තිකාරම් | 350,000,000 | 125,000,000 | 430,000,000 | |
| 10 | පළාත් පාලන දෙපාර්තමේන්තුව | 8121 | පළාත් රාඃ නිඃ අත්තිකාරම් | 3,500,000 | 1,200,000 | 6,300,000 | |
| 11 | සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | 8131 | පළාත් රාඃ නිඃ අත්තිකාරම් | 4,500,000 | 2,000,000 | 6,500,000 | |
| 12 | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | 8141 | පළාත් රාඃ නිඃ අත්තිකාරම් | 1,500,000 | 500,000 | 3,200,000 | |
| 13 | පළාත් මාර්ග සංවර්ධන ග්‍රාමීය යටිතල පහසුකම් සහ සංචාරක අමාත්‍යාංශය | 8201 | පළාත් රාඃ නිඃ අත්තිකාරම් | 4,500,000 | 900,000 | 24,000,000 | |
| 14 | සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක, ග්‍රාම සංවර්ධන සහ ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය | 8301 | පළාත් රාඃ නිඃ අත්තිකාරම් | 8,000,000 | 1,800,000 | 24,000,000 | |
| 15 | කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව | 8311 | පළාත් රාඃ නිඃ අත්තිකාරම් | 9,000,000 | 3,300,000 | 9,000,000 | |
| 16 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | 8321 | පළාත් රාඃ නිඃ අත්තිකාරම් | 1,200,000 | 300,000 | 3,000,000 | |
| 17 | පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව | 8331 | පළාත් රාඃ නිඃ අත්තිකාරම් | 5,500,000 | 1,100,000 | 7,500,000 | |
| 18 | සෞඛ්‍ය දේශීය වෛද්‍ය හා වනිතා කටයුතු අමාත්‍යාංශය | 8401 | පළාත් රාඃ නිඃ අත්තිකාරම් | 3,000,000 | 1,200,000 | 12,500,000 | |
| 19 | සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 8411 | පළාත් රාඃ නිඃ අත්තිකාරම් | 110,000,000 | 50,000,000 | 120,000,000 | |
| 20 | ආයුර්වේද දෙපාර්තමේන්තුව | 8421 | පළාත් රාඃ නිඃ අත්තිකාරම් | 8,000,000 | 5,100,000 | 18,000,000 | |
| 21 | ඉඩම් පළාත්, වාරිමාර්ග, කෘෂිකර්ම සත්ව නිෂ්පාදන හා | 8501 | පළාත් රාඃ නිඃ අත්තිකාරම් | 3,500,000 | 1,400,000 | 52,000,000 | |

| i | ii | iii | iv | v | vi | vii | viii |
|---|---|---|---|---|---|---|---|
| | අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු | විෂය අංකය | අත්තිකාරම් වර්ගය | උපරිම වියදම් සීමාව | අවම ලැබීම් සීමාව | හර ශේෂයේ උපරිම සීමාව | බැරකම්වල උපරිම සීමාව |
| | සත්ව සෞඛ්‍ය පරිසර කටයුතු සහ ධීවර අමාත්‍යාංශය | | | | | | |
| 22 | ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව | 8511 | පළාත් රාः නිः අත්තිකාරම් | 1,200,000 | 600,000 | 3,800,000 | |
| 23 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 8521 | පළාත් රාः නිः අත්තිකාරම් | 15,000,000 | 3,500,000 | 45,000,000 | |
| 24 | සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 8531 | පළාත් රාः නිः අත්තිකාරම් | 7,000,000 | 2,500,000 | 12,500,000 | |
| | උප එකතුව | | | 607,000,000 | 215,200,000 | 921,300,000 | |
| | | | | ========= | ========= | ========= | |
| | වෙනත් අත්තිකාරම් ගිණුම් | | | | | | |
| 25 | පළාත් සභා ලේකම් කාර්යාලය | 8012 | මන්ත්‍රීවරුන්ට විවිධ අත්තිකාරම් | 3,760,000 | 4,224,000 | 13,036,000 | |
| 26 | ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව | 8011 | කළ වැඩ අත්තිකාරම් | 12,500,000 | 5,000,000 | 6,500,000 | 1,000,000 |
| 27 | නීතිය හා සාමය, මුදල් හා සැලසුම්, පළාත් පාලන අධ්‍යාපන හා තොරතුරු තාක්ෂණ ප්‍රවෘත්ති, සංස්කෘතික හා ක්‍රීඩා කටයුතු, විදුලිබල, නිවාස හා ඉදිකිරීම්, සමුපකාර, වෙළඳ හා ආහාර, මගී ප්‍රවාහන හා වතු සුභසාධන කටයුතු අමාත්‍යාංශය | 8102 | මුද්‍රණාල අත්තිකාරම් ගිණුම් | 2,500,000 | 1,000,000 | 2,800,000 | 500,000 |
| 28 | නීතිය හා සාමය, මුදල් හා සැලසුම්, පළාත් පාලන, අධ්‍යාපන හා තොරතුරු තාක්ෂණ, ප්‍රවෘත්ති, සංස්කෘතික හා ක්‍රීඩා කටයුතු, විදුලිබල, නිවාස හා ඉදිකිරීම්, සමුපකාර, වෙළඳ හා ආහාර, මගී ප්‍රවාහන හා වතු සුභසාධන කටයුතු අමාත්‍යාංශය | 8102 | පරිගණක ව්‍යාපෘතිය | 800,000 | 300,000 | 200,000 | 50,000 |
| 28 | නීතිය හා සාමය, මුදල් හා සැලසුම් පළාත් පාලන, අධ්‍යාපන හා තොරතුරු තාක්ෂණ, ප්‍රවෘත්ති, සංස්කෘතික හා ක්‍රීඩා කටයුතු, විදුලිබල, නිවාස හා ඉදිකිරීම්, සමුපකාර, වෙළඳ හා ආහාර, මගී ප්‍රවාහන හා වතු සුභසාධන කටයුතු අමාත්‍යාංශය | 8102 | මෙනේරිපිටිය අටුළුගම අධ්‍යාපන සංවර්ධන මධ්‍යස්ථාන | 3,100,000 | 1,000,000 | 200,000 | 100,000 |
| 29 | කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව | 8312 | පේෂකර්ම වැඩපලවල් පිහිටුවීම හා පරිපාලනය | 10,000,000 | 8,000,000 | 2,000,000 | 800,000 |
| 30 | කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව | 8313 | කුඩා කර්මාන්ත වැඩපලවල් පිහිටුවීම හා පරිපාලනය | 10,000,000 | 5,000,000 | 5,000,000 | 500,000 |
| | | | | _________ | _________ | _________ | _______ |
| | උප එකතුව | | | 42,660,000 | 24,524,000 | 29,736,000 | 2,950,000 |
| | | | | ========= | ========= | ========= | ======= |
| | මුළු එකතුව | | | 649,660,000 | 239,724,000 | 951,036,000 | 2,950,000 |
| | | | | ========== | ========== | ========== | ======= |

"සබරගමුව පළාත් සභාවේ 2009 අංක 06 දරන විසර්ජන ප්‍රඥප්තිය" නැමති මෙම ප්‍රඥප්ති කෙටුම්පත 2009.12.03 වන දින පැවති සබරගමුව පළාත් සභාවේ සභා රැස්වීමේදී යථා පරිදි සම්මත කරන ලද බව මෙයින් සහතික කරමි.

අතුල කුමාර රාහුබද්ද,
සභාපති,
සබරගමුව පළාත් සභාව.

2009 ක් වූ දෙසැම්බර් මස 07 වැනි දින,
සබරගමුව පළාත් සභාවේ දී ය.

2009 ක් වූ දෙසැම්බර් මස 15 වැනි දින දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154ඡ (2) වගන්තිය යටතේ අනුමැතිය දෙමි.

ජානක බණ්ඩාර,
ආණ්ඩුකාරවර,
සබරගමුව පළාත.

01-319

## සබරගමුව පළාත් සභාව

### සබරගමුව පළාත් සභාවේ 2009 අංක 07 දරන විසර්ජන (සංශෝධන) ප්‍රඥප්තිය

සහතිකය සටහන් කළේ : 2009.12.03
අනුමැතිය ලැබුණේ : 2009.12.15

සබරගමුව පළාත් සභාවේ නියමය පරිදි,

ලලිත් දොඩම්කොටුව,
සභා ලේකම්,
සභා ලේකම් කාර්යාලය,
සබරගමුව පළාත් සභාව.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාත් සභාවේ**

***2009 අංක 04 දරන විසර්ජන ප්‍රඥප්තිය සංශෝධනය සඳහා වූ ප්‍රඥප්තියකි***

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මේ ප්‍රඥප්තිය සබරගමුව පළාත් සභාවේ 2009 අංක 07 දරන විසර්ජන (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර සබරගමුව පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණ දින සිට ක්‍රියාත්මක වන්නේ ය.

2. 2009 අංක 04 දරන විසර්ජන ප්‍රඥප්තියේ 2 ඡේදයෙහි "2009 මුදල් වර්ෂය යනුවෙන් සඳහන් කරනු ලබන 2009 ජනවාරි 01 දිනයෙන් ආරම්භව 2009 දෙසැම්බර් 31 දිනයෙන් අවසන් වන කාල සීමාවේ සේවා වියදම් සඳහා අවශ්‍ය වේ යයි තක්සේරු කර ඇති රුපියල් දහතුන් දහස් හාරසිය හැත්තෑඅට මිලියන දෙසිය අනූඑක්දහස් හාරසිය විසිහතරකුත් ශත විසිහයක් (රු. 13,478,291,424.26) වූ සබරගමුව පළාත් සභාවේ වියදම" යන්න" 2009 මුදල් වර්ෂය යනුවෙන් සඳහන් කරනු ලබන 2009 ජනවාරි මස 01 වැනි දිනයෙන් ආරම්භව 2009 දෙසැම්බර් මස 31 වැනි දිනයෙන් අවසන් වන කාල සීමාවේ සේවා වියදම් සඳහා අවශ්‍ය වේ යයි තක්සේරු කර ඇති රුපියල් දහතුන්දහස් පන්සිය දෙක මිලියන අසූ හතර දහස් හයසිය හැටහතකුත් ශත දහසයක් (රු. 13,502,084,667.16) වූ සබරගමුව පළාත් සභාවේ වියදම" යනුවෙන් සහ එහි I වැනි උපලේඛනය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ :–

*පළමුවන උපලේඛනය*

*පළාත් සභා පොදු සේවාවන් සඳහා ගෙවිය යුතු මුදල්*

| ශීර්ෂ 800 සිට 861 දක්වා | රු. ශත |
|---|---|
| පුනරාවර්තන වියදම් | 10,692,805,000.00 |
| ප්‍රාග්ධන වියදම් | 2,809,279,667.16 |
| එකතුව | 13,502,084,667.16 |
| | ============ |

| | පුනරාවර්තන වියදම් රු. ශත | ප්‍රාග්ධන වියදම් රු. ශත |
|---|---|---|
| ශීර්ෂ 800 - ආණ්ඩුකාරතුමාගේ කාර්යාලයේ<br>වැඩ සටහන 03 - පළාත් සභා පරිපාලනය | 31,557,000.00 | - |
| ශීර්ෂ 801- පළාත් සභා ලේකම් කාර්යාලය<br>වැඩ සටහන 03 - පළාත් සභා පරිපාලනය | 81,147,000.00 | - |
| ශීර්ෂ 802 - පළාත් රාජ්‍ය සේවා කොමිෂම<br>වැඩ සටහන 03 - පළාත් සභා පරිපාලනය | 10,019,000.00 | - |
| ශීර්ෂ 803 - සමූපකාර සේවක කොමිෂන් සභාව<br>වැඩ සටහන 03 - පළාත් සභා පරිපාලනය | 2,800,000.00 | - |
| ශීර්ෂ 804 - ප්‍රධාන ලේකම්<br>වැඩ සටහන 03 - පළාත් සභා පරිපාලනය | 125,526,000.00 | 474,720,667.16 |
| ශීර්ෂ 805 - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)<br>වැඩ සටහන 03 - පළාත් සභා පරිපාලනය | 16,018,000.00 | - |

| | පුනරාවර්තන වියදම් රු. ශත | ප්‍රාග්ධන වියදම් රු. ශත |
|---|---|---|
| ශීර්ෂ 806 - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය කළමණාකරන) | | |
| වැඩ සටහන 03 - පළාත් සභා පරිපාලනය | 18,137,000.00 | - |
| ශීර්ෂ 807 - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) | | |
| වැඩ සටහන 03 -පළාත් සභා පරිපාලනය | 14,027,000.00 | - |
| ශීර්ෂ 808 - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) | | |
| වැඩ සටහන 50 - ඉදිකිරීම් හා මහා මාර්ග නඩත්තුව | 104,351,000.00 | - |
| ශීර්ෂ 809 - ආදායම් දෙපාර්තමේන්තුව | | |
| වැඩ සටහන 03 - පළාත් සභා පරිපාලනය | 34,098,000.00 | - |
| ශීර්ෂ 810 - නීතිය හා සාමය, මුදල් හා සැලසුම්, පළාත් පාලන, අධ්‍යාපන හා තොරතුරු තාක්ෂණ, ප්‍රවෘත්ති, සංස්කෘතික හා ක්‍රීඩා කටයුතු, විදුලි බල, නිවාස හා ඉදිකිරීම්, සමුපකාර, වෙළඳ හා ආහාර, මගී ප්‍රවාහන සහ වතු සුභ සාධන කටයුතු අමාත්‍යාංශය | | |
| වැඩ සටහන 03 - පළාත් සභා පරිපාලනය | 56,770,000.00 | 13,000,000.00 |
| වැඩ සටහන 47 - මගී ප්‍රවාහනය | - | 30,000,000.00 |
| වැඩ සටහන 49 - විදුලි බල හා බල ශක්ති සේවා | - | 40,000,000.00 |
| වැඩ සටහන 52 - ප්‍රාදේශීය සංවර්ධනය | - | - |
| වැඩ සටහන 53 - සමුපකාර සංවර්ධනය | - | 10,000,000.00 |
| වැඩ සටහන 60 - ප්‍රජා සංවර්ධනය | - | 85,000,000.00 |
| වැඩ සටහන 61 - නිවාස සහ ප්‍රජා පහසුකම් | 1,533,000.00 | 25,000,000.00 |
| වැඩ සටහන 63 - වැවිලි යටිතල පහසුකම් හා වතු නිවාස | - | 15,000,000.00 |
| වැඩ සටහන 80 - ප්‍රාථමික අධ්‍යාපනය | - | 193,559,000.00 |
| වැඩ සටහන 81 - ද්විතීයික අධ්‍යාපනය | - | 231,000,000.00 |
| වැඩ සටහන 83 - වෘත්තීය පුහුණු හා කාර්මික අධ්‍යාපනය | - | - |
| වැඩ සටහන 87 - අධ්‍යාපන සහභාගිත්වය හා ප්‍රවිෂ්ඨ වීම වැඩි දියුණු කිරීම | - | - |
| වැඩ සටහන 90 - විනෝද කටයුතු හා ක්‍රීඩා | - | 31,000,000.00 |
| වැඩ සටහන 93 - ආගමික හා සංස්කෘත කටයුතු | 1,450,000.00 | 15,000,000.00 |
| ශීර්ෂ 811 - අධ්‍යාපන දෙපාර්තමේන්තුව | | |
| වැඩ සටහන 03 - පළාත් සභා පරිපාලනය | 202,314,000.00 | - |
| වැඩ සටහන 80 - ප්‍රාථමික අධ්‍යාපනය | 1,896,278,000.00 | - |
| වැඩ සටහන 81 - ද්විතීයික අධ්‍යාපනය | 3,855,910,000.00 | - |
| වැඩ සටහන 87 - අධ්‍යාපන සහභාගිත්වය වැඩිදියුණු කිරීම | 4,570,000.00 | |
| වැඩ සටහන 88 - අධ්‍යාපන සැළසුම්කරණය, පාලනය හා සේවා සැපයීම | 6,375,000.00 | - |
| ශීර්ෂ 812 - පළාත් පාලන දෙපාර්තමේන්තුව | | |
| වැඩ සටහන 03 - පළාත් සභා පරිපාලනය | 4,990,000.00 | - |
| වැඩ සටහන 60 - ප්‍රජා සංවර්ධනය | 1,089,225,000.00 | - |
| ශීර්ෂ 813 - සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | | |
| වැඩ සටහන 53 - සමූපකාර සංවර්ධනය | 39,713,000.00 | - |
| ශීර්ෂ 814 - ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | | |
| වැඩ සටහන 90 - විනෝද කටයුතු හා ක්‍රීඩා | 8,441,000.00 | - |
| ශීර්ෂ 820 - පළාත් මාර්ග සංවර්ධන, ග්‍රාමීය යටිතල පහසුකම් සහ සංචාරක අමාත්‍යාංශය | | |
| වැඩ සටහන 03 - පළාත් සභා පරිපාලනය | 24,623,000.00 | |
| වැඩ සටහන 50 - ඉදි කිරීම් හා මහා මාර්ග නඩත්තුව | 105,000,000.00 | 985,000,000.00 |
| වැඩ සටහන 52 - ප්‍රාදේශීය සංවර්ධනය | - | 25,000,000.00 |
| වැඩ සටහන 90 - විනෝද කටයුතු හා ක්‍රීඩා | - | 32,000,000.00 |

| | පුනරාවර්තන වියදම් රු. ශත | ප්‍රාග්ධන වියදම් රු. ශත |
|---|---|---|
| ශීර්ෂ 830 - සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂක, ග්‍රාම සංවර්ධන සහ ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය | | |
| වැඩ සටහන 03 - පළාත් සභා පරිපාලනය | 19,693,000.00 | |
| වැඩ සටහන 51 - කර්මාන්ත සංවර්ධනය | - | 30,000,000.00 |
| වැඩ සටහන 60 - ප්‍රජා සංවර්ධන කටයුතු | 16,955,000.00 | 15,000,000.00 |
| වැඩ සටහන 61 - නිවාස සහ ප්‍රජා පහසුකම් | - | |
| වැඩ සටහන 90 - විනෝද කටයුතු හා ක්‍රීඩා | - | |
| වැඩ සටහන 95 - සමාජ ආරක්ෂණය | | 45,000,000.00 |
| ශීර්ෂ 831- කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව | | |
| වැඩ සටහන 51 - කර්මාන්ත සංවර්ධනය | 60,852,000.00 | |
| ශීර්ෂ 832 - සමාජ සේවා දෙපාර්තමේන්තුව | | |
| වැඩ සටහන 95 - සමාජ ආරක්ෂණය | 83,329,000.00 | |
| ශීර්ෂ 833 - පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව | | |
| වැඩ සටහන 95 - සමාජ ආරක්ෂණය | 35,907,000.00 | |
| ශීර්ෂ 840 - සෞඛ්‍ය, දේශීය වෛද්‍ය සහ වනිතා කටයුතු අමාත්‍යාංශය | | |
| වැඩ සටහන 03 - පළාත් සභා පරිපාලනය | 24,648,000.00 | |
| වැඩ සටහන 71 - රෝහල සේවාවන් | - | 208,420,000.00 |
| වැඩ සටහන 72 - මහජන සෞඛ්‍ය සේවාවන් | - | 113,580,000.00 |
| වැඩ සටහන 73 - දේශීය වෛද්‍ය සේවාවන් | - | 45,000,000.00 |
| වැඩ සටහන 96 - කාන්තා කටයුතු | - | 10,000,000.00 |
| ශීර්ෂ 841- සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | | |
| වැඩ සටහන 03 - පළාත් සභා පරිපාලනය | 120,500,000.00 | - |
| වැඩ සටහන 71 - රෝහල් සේවාවන් | 1,723,213,000.00 | - |
| වැඩ සටහන 72 - මහජන සෞඛ්‍ය සේවාවන් | 523,740,000.00 | - |
| ශීර්ෂ 842- ආයුර්වේද දෙපාර්තමේන්තුව | | |
| වැඩ සටහන 73 - දේශීය වෛද්‍ය සේවාවන් | 139,972,000.00 | - |
| ශීර්ෂ 850- ඉඩම්, පළාත් වාරිමාර්ග, කෘෂිකර්ම, සත්ව නිෂ්පාදන හා සත්ව සෞඛ්‍ය, පරිසර කටයුතු සහ ධීවර අමාත්‍යාංශය | | |
| වැඩ සටහන 03 -පළාත් සභා පරිපාලනය | 23,501,000.00 | 6,000,000.00 |
| වැඩ සටහන 40 - ඉඩම් පරිපාලනය හා සංවර්ධනය | | 8,000,000.00 |
| වැඩ සටහන 43 - වාරි මාර්ග හා ජල කළමණාකරණය | - | 30,000,000.00 |
| වැඩ සටහන 44 - කෘෂිකාර්මික සංවර්ධනය | - | 50,000,000.00 |
| වැඩ සටහන 45 - පශු සම්පත් සංවර්ධනය | - | 40,000,000.00 |
| වැඩ සටහන 55 - ආහාර සුරක්ෂිතතාව පවත්වා ගැනීම | - | 3,000,000.00 |
| වැඩ සටහන 57 - පරිසර සංරක්ෂණය | - | - |
| ශීර්ෂ 851-ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව | | |
| වැඩ සටහන 40 - ඉඩම් පරිපාලනය හා සංවර්ධනය | 9,069,000.00 | - |
| ශීර්ෂ 852-කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | | |
| වැඩ සටහන 44 - කෘෂිකාර්මික සංවර්ධනය | 80,372,000.00 | - |
| ශීර්ෂ 853- සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | | |
| වැඩ සටහන 45 - පශු සම්පත් සංවර්ධනය | 85,984,000.00 | - |
| ශීර්ෂ 861- පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව | | |
| වැඩ සටහන 3 - පළාත් සභා පරිපාලනය | 10,198,000.00 | – |
| එකතුව | 10,692,805,000.00 | 2,809,279,667.16 |
| | ============== | ============ |

**අත්තිකාරම් උපලේඛනය**

1. සීමා සංශෝධනය

| *විෂය අංකය* | | *අනුමත සීමාව රු. ශත* | *සංශෝධිත සීමාව රු. ශත* |
|---|---|---|---|
| 8301 | සමාජ සුභ සාධන පරිවාස හා ළමා රක්ෂක, ග්‍රාම සංවර්ධන හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය | 2,600,000.00 | 1,800,000.00 |
| 8321 | සමාජ සේවා දෙපාර්තමේන්තුව හර ශේෂයේ උපරිම සීමාව | 300,000.00 | 285,000.00 |
| 8421 | ආයුර්වේද දෙපාර්තමේන්තුව | 5,100,000.00 | 4,750,000.00 |

2009.12.03 වැනි දින පැවති සබරගමුව පළාතේ පළාත සභාව විසින් සම්මත කරන ලද "2009 අංක 07 දරන විසර්ජන (සංශෝධන) ප්‍රඥප්තිය" නැමති ප්‍රඥප්ති කෙටුම්පතේ සත්‍ය පිටපතක් මෙහ අන්තර්ගත කර ඇති බව මෙයින් සහතික කරමි.

ලලිත් දොඩම්කොටුව,
සභා ලේකම්,
සබරගමුව පළාත් සභාව.

2009 ක් වූ දෙසැම්බර් මස 04 වැනි දින,
සබරගමුව පළාත් සභාවේ දී ය.

"සබරගමුව පළාත් සභාවේ 2009 අංක 07 දරන විසර්ජන (සංශෝධන) ප්‍රඥප්තිය" නැමති මෙම ප්‍රඥප්ති කෙටුම්පත 2009.12.03 වැනි දින පැවති සබරගමුව පළාත් සභාවේ සභා රැස්වීමේ දී යථා පරිදි සම්මත කරන ලද බව මෙයින් සහතික කරමි.

අතුල කුමාර රාහුබද්ධ,
සභාපති,
සබරගමුව පළාත් සභාව.

2009 ක් වූ දෙසැම්බර් මස 07 වැනි දින,
සබරගමුව පළාත් සභාවේ දී ය.

2009 ක් වූ දෙසැම්බර් මස 15 වැනි දින දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154(ඌ)(2) වගන්තිය යටතේ අනුමැතිය දෙමි.

ජානක බණ්ඩාර,
ආණ්ඩුකාරවර,
සබරගමුව පළාත.

01-315

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.